# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2261/9 – 2022 ජනවාරි මස 04 වැනි අඟහරුවාදා – 2022.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 12ඒ, දියගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දියගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක KE/KGL/2019/217 සහ 2020.01.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කොටස් 3ට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – පතහමුල්ල සහ කැකුලන්ගේහේන, ගුරුගේහේන, මොරගොල්ලේහේන, කීරඉඹුල්තැන්න, දීයන්ගල්ඇන්ද හේන, කීරඉඹුල්තැන්න දොළේ හේන, වෙලගාව හේන නොහොත් පීල්ලගාව හේන සහ වාගොල්ලේහේන – ප්‍රමාණය: හෙක්. 4.5020**

උතුරට: කෙරෙඹුල්ල කුඹුර, මාර්ගය සහ උණපඳුරේ හේන; නැගෙනහිරට: මාර්ගය, උණපඳුරේ හේන, කැබලි අක්ෂර B සහ තරංග කැපුම් හේන; දකුණට: කලුගල්ල ගම් මායිම; බටහිරට: ගල්කොටුව, වාගොල්ලේහේන, මාර්ගය සහ කෙරෙඹුල්ල කුඹුර.

02. කැබලි අක්ෂර **‘B’ – ප්‍රමාණය:** හෙක්. 0.0134

උතුරට: කැබලි අක්ෂර A, උණපඳුරේ හේන සහ කැබලි අක්ෂර C; නැගෙනහිරට සහ දකුණට: කැබලි අක්ෂර C සහ තරංග කැපුම් හේන; බටහිරට: කැබලි අක්ෂර A සහ උණපඳුරේ හේන.

03. **කැබලි අක්ෂර ‘C’ – පතහමුල්ල සහ කැකුලන්ගේහේන, ගුරුගේහේන, මොරගොල්ලේහේන, කීරඉඹුල්තැන්න, දීයන්ගල්ඇන්ද හේන, කීරඉඹුල්තැන්න දොළේ හේන, වෙලගාව හේන නොහොත් පීල්ලගාව හේන සහ වාගොල්ලේහේන – ප්‍රමාණය: හෙක්. 2.2351**

උතුරට සහ නැගෙනහිරට: බොරළුව; දකුණට: කලුගල්ල ගම් මායිම; බටහිරට: කලුගල්ල ගම් මායිම, තරංග කැපුම් හේන, කැබලි අක්ෂර B සහ උණපඳුරේ හේන.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/3/2019/Z/145.
2021 නොවැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0009


1A – G 35729 – 25 (2022/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුඅහ පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 56බී, උඳුගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, උඳුගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KE/KGL/2020/140 සහ 2020.10.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – යටිදැරිය වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0506**

උතුරට: යටිදැරිය වත්ත; නැගෙනහිරට: යටිදැරිය වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ යටිදැරිය වත්ත; බටහිරට: යටිදැරිය වත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2019/VE/375.
2021 දෙසැම්බර් මස 01 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0010

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.